සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA2 විභාගය - 2015 ජූලි

## (AA23) ව්‍යාපාර මෙහෙයුම් සහ කළමනාකරණය

(Business Operations and Management)

2015-08-01
පස්වරු
[2.00 – 5.00]

පිටු ගණන : 08
ප්‍රශ්න ගණන: 10

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):
  (1) ***කාලය:*** *පැය 03 යි.*
  (2) ***සියලුම ප්‍රශ්න වලට උත්තර සැපයීම අනිවාර්ය වේ.***
  (3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*
  (4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*
  (5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*
  (6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
  (7) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

අනිවාර්යය ප්‍රශ්න දොළහ (12) කි.

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.11 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.1 පහත දැක්වෙන ඒවා අතුරෙන් උපකාරක සේවා (auxiliary services) නිවැරදිව ඇතුළත් කාණ්ඩය කුමක් ද?

(1) වෙළෙඳාම සහ බැංකුකරණය.
(2) ප්‍රවාහනය සහ අපනයනය.
(3) රක්ෂණය සහ සන්නිවේදනය.
(4) ගබඩා කළමනාකරණය සහ තොග වෙළෙඳාම. (ලකුණු 01)

1.2 පහත දැක්වෙන ඒවා අතුරෙන් පෞද්ගලික සමාගමක් සම්බන්ධයෙන් සත්‍ය වන්නේ කුමක් ද?

(1) උපරිම කොටස්කරුවන් ගණන හතකි.
(2) අවම අධ්‍යක්ෂවරුන් ගණන දෙදෙනෙකි.
(3) මූල්‍ය ප්‍රකාශන ප්‍රකාශයට පත්කිරීම අනිවාර්යය නොවේ.
(4) කොටස් හුවමාරුවට (transfer) බාධා නොමැත. (ලකුණු 01)

1.3 ව්‍යාපාරයක් පවත්වාගෙන යාමේ අරමුණ මත පුද්ගලික අංශයේ ව්‍යාපාරයක් රාජ්‍ය අංශයේ ව්‍යාපාරයකින් වෙන්කර දැක්විය හැකිය. රාජ්‍ය අංශයේ ව්‍යාපාර පවත්වාගෙන යාමේ ප්‍රධාන අරමුණ වන්නේ:

(1) වෙළෙඳපොළ ආර්ථික ක්‍රමය සුමටව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සේවා සැපයීම ය.

(2) යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම ය.

(3) අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම ය.

(4) ඒකාධිකාරී වෙළෙඳපොළවල් පාලනය කිරීම ය. (ලකුණු 02)

1.4 **සීමාසහිත XYZ සමාගම, X** රටෙහි ක්‍රියාත්මකවන අතර **සීමාසහිත XYZ සමාගමේ** නිෂ්පාදිතයන් සඳහා එම රටේ ඉතා ප්‍රබල ඉල්ලුමක් පවතී. කෙසේවෙතත්, **සීමාසහිත XYZ සමාගමේ** නිමැවුම් අංශය බරපතල සේවක හිඟයකට මුහුණ පා සිටී. උපායශීලී සැළසුම්කරණයේ දී පහත දැක්වෙන ඒවා අතුරෙන් කුමන පරිසරය සළකා බැලීම සිදු කළ යුතු ද?

(1) බාහිර පරිසරය. (2) විදේශ පරිසරය.

(3) සාර්ව පරිසරය. (4) අභ්‍යන්තර පරිසරය. (ලකුණු 02)

1.5 පහත දැක්වෙන ඒවා අතුරෙන් සූක්ෂ්ම පරිසරයේ (Micro Environment) සංරචකයක් **නොවන්නේ** කුමක් ද?

(1) පාරිභෝගිකයින්. (2) තරඟකරුවන්.

(3) සැපයුම්කරුවන්. (4) රජය. (ලකුණු 01)

1.6 පහත දැක්වෙන ඒවා අතුරෙන් පෝටර්ගේ අගය දාමයට (Porter's Value Chain) අනුව ප්‍රාථමික කාර්යයක් (primary activity) වන්නේ කුමක් ද?

(1) මානව සම්පත් කළමනාකරණය. (2) ආයතනයේ යටිතල පහසුකම්.

(3) ප්‍රසම්පාදනය (Procurement). (4) අභ්‍යන්තර සැපයුම (Inbound Logistic).

(ලකුණු 02)

1.7 පහත දැක්වෙන ඒවා අතුරෙන් තොග කළමනාකරණය සම්බන්ධයෙන් සත්‍ය වන්නේ කුමක් ද?

(1) තොග නිතිපතා අධීක්ෂණය කිරීම, අඛණ්ඩ තොග කළමනාකරණ පද්ධතියේ ගුණාංගයක් නොවේ.

(2) පවත්වා ගෙනයනු ලබන තොග ප්‍රතිසම්පාදනය (replacing) කිරීම සම්බන්ධයෙන් දැරීමට වන පිරිවැය, තොග පවත්වාගෙන යාමේ පිරිවැය ලෙස හඳුන්වනු ලැබේ.

(3) තොග පවත්වාගෙන යාමේ පිරිවැයත් ඇණවුම් කිරීමේ පිරිවැයත් අවම කරන ප්‍රශස්ත ඇණවුමේ ප්‍රමාණය ආර්ථික ඇණවුම් ප්‍රමාණය (Economic Order Quantity - EOQ) වේ.

(4) ගබඩාකරණ පිරිවැය අවම වීම, සම්ප්‍රදායික තොග කළමනාකරණ පද්ධතියේ එක් වාසියකි. (ලකුණු 02)

1.8 පහත දැක්වෙන ඒවා අතුරෙන් ආයතනයක අභ්‍යන්තර සේවකයන් අතර තොරතුරු / කරුණු බෙදාගැනීමට සහ තොරතුරු තාක්ෂණ සම්පත් භාවිත කිරීමට අනුමැතිය / අවස්ථාව ලැබෙන්නේ කුමකින් ද?

(1) තොරතුරු කළමනාකරණ පද්ධතියෙනි. (2) අභ්‍යන්තර ජාලයෙනි (Intranet).

(3) අන්තර්ජාලයෙනි (Internet). (4) බාහිර ජාලයෙනි (Extranet). (ලකුණු 02)

1.9 පහත දැක්වෙන ඒවා අතුරෙන් "සේවක හා කම්කරු සබඳතා" යන්නට අයත්වන ශ්‍රිතය (කාර්යය) තෝරන්න.

(1) මිනිස්බල සැළසුම්කරණය. (2) ත්‍යාග කළමනාකරණය.

(3) විනය කළමනාකරණය. (4) කාර්යසාධනය ඇගයීම. (ලකුණු 02)

1.10 පහත දැක්වෙන රක්ෂණ සංකල්ප අතුරෙන් ජීවිත රක්ෂණ ඔප්පු වලට අදාළ වන්නේ කුමක් ද?

(1) හානිපූරණය (Indemnity). (2) ආදේශනය (Subrogation).

(3) දායකත්වය (Contribution). (4) උපරිම විශ්වාසය (Utmost good faith).

(ලකුණු 02)

1.11 SWOT විශ්ලේෂණයේ දී සලකා බලන බාහිර සාධක වන්නේ:

(1) අවස්ථාවන් සහ දුර්වලතාවයන් ය. (2) ශක්තීන් සහ දුර්වලතාවයන් ය.

(3) අවස්ථාවන් සහ තර්ජනයන් ය. (4) තර්ජනයන් සහ දුර්වලතාවයන් ය.

(ලකුණු 02)

පහත දැක්වෙන ප්‍රශ්නයට, උත්තරය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.

1.12 මානව සම්පත් කළමනාකරණ (Human Resource Management - HRM) ශ්‍රිතයයන් (කාර්යයන්) හි විෂය පථය (scope) පැතිකඩ තුනක් යටතේ වර්ගීකරණය කළ හැකිය. පෞද්ගලික (personnel) සහ සුභසාධන (welfare) පැතිකඩ ඒවායෙන් දෙකකි. මානව සම්පත් කළමනාකරණ ශ්‍රිතයයන්හි අනෙක් පැතිකඩ නම් කරන්න.

(ලකුණු 01)

*A කොටසෙහි අවසානය*

## B කොටස

අනිවාර්යය ප්‍රශ්න පහ (05) කි.

(මුළු ලකුණු 25)

### 02 වන ප්‍රශ්නය

"සීමිත සම්පත් භාවිත කරමින් ඉලක්ක සපුරා ගැනීම සඳහා කටයුතු කරන ඕනෑම සංවිධානයකට කළමනාකරණය ඉතා වැදගත් වේ".

කළමනාකරණයේ ප්‍රධාන සංකල්ප තුන(03) කෙටියෙන් **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

### 03 වන ප්‍රශ්නය

"රක්ෂණය යනු අවදානම් කළමනාකරණය කිරීමේ මාධ්‍යයකි. අවදානම් කළමනාකරණය කිරීමට අවශ්‍ය පුද්ගලයනට රක්ෂණ ආයතන මඟින් රක්ෂණ ඔප්පු පිරිනමයි."

"ප්‍රති රක්ෂණ" (Re-insurance) සංකල්පය සුදුසු උදාහරණයක් භාවිත කරමින් **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

"ගුණත්වය සඳහා වඩාත් ප්‍රමුඛ සහ දෘශ්‍යමාන ප්‍රවේශය වී තිබෙන්නේ සමස්ත තත්ත්ව කළමනාකරණයයි (Total Quality Management - TQM). එය ගුණත්වය වැඩි දියුණු කිරීම සඳහා ජපන් ශෛලියකින් යුතු කළමනාකරණ ප්‍රවේශයක් ලෙස බිහි වී 1990 දශකයේ වඩාත් ජනප්‍රියත්වයට පත් විය".

සමස්ත තත්ත්ව කළමනාකරණයේ (TQM) ඕනෑම මූලධර්ම පහක්(05) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 05)

## 05 වන ප්‍රශ්නය

**ZED ව්‍යාපාර පාසල** අධ්‍යාපන ක්ෂේත්‍රයේ ක්‍රියාත්මකවන අලුතින් සංස්ථාපනය කරන ලද සීමාසහිත පුද්ගලික සමාගමකි. එහෙයින්, ආයතනයේ සම්පත් අතුරෙන් ශක්තිසම්පන්න (energetic) සම්පතක් ලෙස මානව සම්පත හඳුනාගත හැකිය. කෙසේ වෙතත්, එහි අධ්‍යයන කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය ඇගයීම සඳහා සුදුසු ඇගයීමේ ක්‍රමයක් **ZED ව්‍යාපාර පාසල** මගින් ක්‍රියාත්මකකර නොතිබුණි. එහෙයින්, කාර්යසාධනය ඇගයීමේ සුදුසු ක්‍රියාවලියක් සංවර්ධනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබේ.

ඔබ **ZED ව්‍යාපාර පාසලේ** මානව සම්පත් විධායක (Human Resource Executive) ලෙස කටයුතු කරන අතර කාර්යසාධනය ඇගයීමේ සඵලදායී පද්ධතියක් (Effective Performance Appraisal System) සඳහා යෝජනාවලියක් (proposal) පිළියෙල කරන ලෙස මානව සම්පත් කළමනාකරු විසින් ඔබෙන් ඉල්ලා සිටින බව උපකල්පනය කරන්න.

**ZED ව්‍යාපාර පාසල** සඳහා ඔබ යෝජනා කරන්නා වූ කාර්යසාධන ඇගයීමේ ක්‍රමයේ වැදගත් ගුණාංග **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

## 06 වන ප්‍රශ්නය

වර්තමාන ව්‍යාපාර පරිසරයේ ක්‍රියාත්මකවන ව්‍යාපාර සංවිධාන අන්තර්ජාලය හරහා ලොව පුරා ව්‍යාපාර කටයුතු සිදු කරයි. එහෙයින්, ව්‍යාපාර කටයුතු පහසු කිරීමෙහි ලා අන්තර්ජාලය වැදගත් කාර්යයක් ඉටු කරයි.

වර්තමාන ගතික ව්‍යාපාර පරිසරයේ (dynamic business environment) ක්‍රියාත්මකවන ව්‍යාපාර සංවිධානයකට අන්තර්ජාලයෙන් ලබාගත හැකි වාසි පහක්(05) **ලැයිස්තුගත කරන්න**.

(ලකුණු 05)

*B කොටසෙහි අවසානය*

## C කොටස

අනිවාර්යය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

### 07 වන ප්‍රශ්නය

**මැක්‍රෝ** යනු මෝටර් රථ කර්මාන්තයේ නියැලී සිටින ප්‍රධාන පෙළේ කාර් නිෂ්පාදකයෙකි. ඇණවුම් පිරිවැය, ඇණවුමකට රුපියල් මිලියන 10 ක් වන අතර පවත්වාගෙන යාමේ පිරිවැය, වර්ෂයකට රු.500,000/- කි. කාර් සඳහා වාර්ෂික ඉල්ලුම කාර් 2,250 ක් වෙතැයි පුරෝකථනය කර තිබේ.

**මැක්‍රෝ** ආයතනය එහි තොග කළමනාකරණය කිරීම සඳහා සම්ප්‍රදායික තොග කළමනාකරණ පද්ධතියක් භාවිත කරයි. කෙසේ වෙතත්, මෑතක දී බඳවා ගන්නා ලද නිෂ්පාදන කළමනාකරු පවත්නා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අකමැති බැවින් ඔහු විසින් රැස්වීමකදී අධ්‍යක්ෂ මණ්ඩලය වෙත තත්කාලීන තොග කළමනාකරණ පද්ධතිය (Just in Time - JIT) නමැති වෙනත් පද්ධතියක් යෝජනා කරන ලදී. තවද, ඔහුගේ යෝජනාව සාධාරණීකරණය කිරීම සඳහා ඔහු විසින් ගෝලීය මෝටර් රථ කර්මාන්තයේ සාර්ථක වූ ටොයෝටා වැනි සමාගම් උදාහරණ වශයෙන් ගෙනහැර දක්වා තිබේ. ඉන් පසු, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තොග කළමනාකරණ පද්ධති දෙක පිළිබඳව වාර්තාවක් පිළියෙල කරන ලෙස ඔහුගෙන් ඉල්ලා තිබේ.

**ඔබ විසින්,**

(a) සම්ප්‍රදායික තොග කළමනාකරණ පද්ධතිය හා JIT පද්ධතිය අතර වෙනස්කම් **හඳුනා දක්වන්න**. (ලකුණු 04)

(b) පහත දැක්වෙන දෑ **ගණනය කරන්න**.

(i) ඇණවුමේ ප්‍රමාණය (Order Size).

(ii) වර්ෂයකට අවශ්‍යකරන ඇණවුම් ප්‍රමාණය.

(iii) වාර්ෂික තොග පවත්වාගෙන යාමේ පිරිවැය.

(iv) වාර්ෂික ඇණවුම් කිරීමේ පිරිවැය. (ලකුණු 06)

(මුළු ලකුණු 10)

### 08 වන ප්‍රශ්නය

**D සහ D සමාගම** යනු කොළඹ නගර සීමාව තුළ ක්‍රියාත්මකවන මධ්‍යම පරිමාණයේ ප්‍රචාරණ සමාගමකි. සමාගම, සේවකයින් කළමනාකරණය කිරීමේ අවශ්‍යතාව අවබෝධකර ගත් බැවින් මෑතක දී මානව සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවක් එහි ස්ථාපිත කරන ලදී.

දක්ෂතා කළමනාකරණ (Talent Management) සංකල්පය මෙම සමාගමට හඳුන්වාදෙන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අලුතින් පත් වූ මානව සම්පත් කළමනාකරුගෙන් ඉල්ලා සිටී.

**ඔබ විසින්,**

(a) දක්ෂතා කළමනාකරණයේ ප්‍රධාන පැතිකඩ (aspects) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(b) දක්ෂතා කළමනාකරණයේ වැදගත්කම **D සහ D සමාගමට** ඒත්තු ගැන්වීම සඳහා වාර්තාවක් **පිළියෙල කරන්න.**

(ලකුණු 08)

(මුළු ලකුණු 10)

## 09 වන ප්‍රශ්නය

වේගවත් අන්තර්ජාල සම්බන්ධතා සහ බලසම්පන්න මාර්ගගත උපකරණ (powerful online tools) සොයා ගැනීම හේතුවෙන් සමාගම්වලට හා ගනුදෙනුකරුවන්ට වාසි අත්කර දෙන්නා වූ විද්‍යුත් වාණිජ්‍යය (E-commerce) නමින් හඳුන්වනු ලබන නව වාණිජ යුගයක් උදා වී තිබේ. කෙසේ වෙතත්, එමගින් නොයෙකුත් ප්‍රශ්න ද උද්ගත වී තිබේ.

**ඔබ විසින්,**

(a) විද්‍යුත් වාණිජ්‍යයේ කොටස් හතර(04) නිදර්ශනය කිරීම (illustrate) සඳහා රූප සටහනක් (diagram) **අඳින්න**. එක් එක් කොටස සඳහා උදාහරණය බැගින් **සඳහන් කරන්න**. (ලකුණු 04)

(b) විද්‍යුත් වාණිජ්‍යයේ අවාසි තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(මුළු ලකුණු 10)

*C කොටසෙහි අවසානය*

# <u>D කොටස</u>

අනිවාර්යය ප්‍රශ්නයකි

(ලකුණු 25)

## 10 වන ප්‍රශ්නය

**KIK සමූහ ව්‍යාපාරය**, **X** රටෙහි සිසිල් බීම කර්මාන්තයේ ප්‍රධාන ක්‍රියාකරුවෙකි. එහි සාර්ථකත්වයට දායකත්වය ලබාදෙන්නා වූ මධ්‍යගත ශක්තිමත් පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුවක් සමාගම සතු වේ. **X** රටෙහි ජනතාව පැණි බීම පානය කිරීමට වඩා සෞඛ්‍යයට හිතකර ලෙස සකස් කරන ලද පළතුරු යුෂ පානය කිරීමට වැඩි කැමැත්තක් දක්වන බව, මෑතක දී සමාගම කරන ලද සමීක්ෂණයකින් අනාවරණය කරගෙන ඇත. ශක්‍යතා අධ්‍යයනයකින් පසුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පළතුරු යුෂ නිෂ්පාදනය කිරීමට තීරණය කරන ලදී.

**KIK** හි නිෂ්පාදනය කරන නව පළතුරු යුෂවල සන්නම් නාමය "Juzzy" වේ. ඒකාබද්ධ අලෙවිකරණ වැඩසටහන් (Integrated Marketing Programmes) ක්‍රියාත්මක කිරීම මගින් පාරිභෝගික අවශ්‍යතා තෘප්තිමත්කර නව නිෂ්පාදිතය හරහා ලාභ ඉපයීමට අධ්‍යක්ෂ මණ්ඩලය අපේක්ෂා කරයි.

සතියකට ඉහතදී, අඹ, දොඩම්, ඇපල් හා මිශ්‍ර පළතුරු යන රස වර්ග හතරකින් යුක්තව දේශීය වෙළෙඳපොළට "Juzzy" හඳුන්වා දෙන ලදී. ප්‍රවාහන පිරිවැය අඩුකරනු වස් ගොවිපොළවල් (ගොවීන් 1,000 ක්) සහ කර්මාන්තශාලාව (සේවකයින් 2,500 කින් යුක්ත) එකම භූගෝලීය ප්‍රදේශයක පිහිටුවා තිබේ. නිෂ්පාදන ක්‍රියාවලිය ප්‍රදර්ශනය කෙරෙන කර්මාන්තශාලාවේ ආදර්ශ අලෙවි සැල (model factory sales outlet) ගොවිපොළවල් ආසන්නයේ පිහිටුවා තිබේ. මෙහි පැමිණෙන ගනුදෙනුකරුවන්ට "Juzzy" නිෂ්පාදන ක්‍රියාවලිය අත්දැකිය හැකිය. "Juzzy" මිලිලීටර 120 පැකට්ටු වල සහ මිලිලීටර 500 බෝතල් වශයෙන් වෙළෙඳපොළට ඉදිරිපත් කෙරේ. වෙළෙඳපොළ අල්ලා ගැනීම සඳහා ආකර්ෂණීයව බෝතල් නිර්මාණයකර ඇත.

මෙම නිෂ්පාදිතය **KIK සමාගමේ** සැපයුම් දෙපාර්තමේන්තුව (Logistic Department) මගින් බෙදා හරිනු ලබන අතර එකී නිෂ්පාදිත රට පුරා විකිණීමට තිබේ. පාරිභෝගිකයනට සාධාරණ මිලකට ඕනෑම විකුණුම් හලකින් මෙම නිෂ්පාදිත මිලට ගත හැකිය. තොග වශයෙන් වෙළෙන්දන්ගෙන් මිලට ගන්නා විට ආකර්ෂණීය වට්ටම් හිමි වේ.

අලෙවිකරණ ව්‍යාපෘති මගින් ශ්‍රව්‍ය, දෘෂ්‍ය, විද්‍යුත් නැපැල සහ අනෙකුත් මාර්ගගත (Online) මාධ්‍යයන්, විශේෂයෙන් සමාජීය මාධ්‍යයන් භාවිත කරමින් නව නිෂ්පාදිතය හඳුන්වාදීම පිළිබඳව සාර්ථකව සන්නිවේදනය කර තිබේ. **KIK** ප්‍රධාන වශයෙන් ඉලක්කගත කර ඇත්තේ එම රටෙහි සෞඛ්‍යය පිළිබඳව සැලකිල්ලක් දක්වන ගනුදෙනුකරුවන්ව ය. නිෂ්පාදිතය පිළිබඳ අවශ්‍ය පැහැදිලි කිරීම් ලබා ගැනීම සඳහා සේවා (helpline) දුරකථනයක් මගින් පැය 24 පුරා ම පෝෂණවේදියෙක් සම්බන්ධකර ගැනීමට ආයතනය මගින් පහසුකම් සලසා තිබේ. අවසර ලබා ගෙන **X** රටෙහි පුරවැසියනට කර්මාන්තශාලාව සහ ගොවිපොළවල් නැරඹිය හැකි අතර ගොවියන් සහ සේවකයන් හමුවීමට ද එහිදී හැකි වේ. එයට අමතරව, සේවකයන් සඳහා පවත්වාගෙන යන වැඩමුළු සහ පුහුණු කිරීමේ වැඩසටහන්වල අත්දැකීම් ද ඔවුනට ලැබිය හැකිය. මේ වර්ෂය තුළ කර්මාන්තශාලාව නැරඹීම සඳහා 100 කට වැඩි අයදුම්පත් සංඛ්‍යාවක් විශේෂයෙන් පාසැල් වලින් ලැබී ඇති බව **KIK** කළමනාකරණය මෑතක දී ප්‍රකාශකර තිබේ.

**ඔබ විසින්,**

(a) අලෙවිකරණ මිශ්‍රයේ මූලිකාංග (elements) හත (07) ('P' 7 හි ආදර්ශය) **KIK සමූහ ව්‍යාපාරයේ** "Juzzy" නිෂ්පාදිතයට අදාලකර ගනිමින් **පැහැදිලි කරන්න**. (ලකුණු 10)

(b) දේශීය වෙළෙඳපොළේ "Juzzy" නිෂ්පාදිතය ස්ථානගත කිරීමට යොදා ගන්නා උපායමාර්ග හතරක්(04) උදාහරණ සහිතව **පැහැදිලි කරන්න**. (ලකුණු 08)

(c) අලෙවිකරණ දර්ශන (marketing philosophies) පහක් (05) කෙටියෙන් **පැහැදිලි කරන්න**. ඒවායෙන් **KIK** හි "Juzzy" නිෂ්පාදිතයට අදාල වන දර්ශනය **හඳුනා ගන්න**. (ලකුණු 07)

(මුළු ලකුණු 25)

*D කොටසෙහි අවසානය*

# <u>කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව</u>

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>**අවබෝධය**<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැළකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>**භාවිතය**<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>**විශ්ලේෂණය**<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |